# 49

# උපාධිධාරී ඔබට හර ධර්ම පද්ධතියක්

## ආචාර්ය ඒ. ටී. ආරියරත්න

විද්‍යෝදය පිරිවෙන, විද්‍යෝදය විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය යන නම්වලින් යම් සංස්කෘතියක්, දර්ශනයක්, සංකල්පයක් ඉස්මතු වන්නේ ද මම ද එහි කොටස්කරුවෙක් වෙමි යි ඔබට පවසන්නේ අතිශය සංතෝෂයෙනි. මගේ පියාණන් ද සුළු පියාණන් ද යන දෙදෙනාම විද්‍යාදය පිරිවෙණේ ගිහි ආදි ශිෂ්‍යයෝ වූහ. අතිපූජ්‍ය කළුකොඳයාවේ පඤ්ඤාසේකර මහනාහිමියන් විද්‍යාදය පිරිවෙණේ අධිපති වශයෙන් කටයුතු කළ කාලයේ උන්වහන්සේගේ ආරාධනයෙන් වසර කිහිපයක්ම සවස් වරුවේ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ සෞඛ්‍ය විද්‍යාව ඉගැන්වීමට තරම් මම වාසනාවන්තයෙක් වීමි. ඒ කාලයේ මම කොළඹ නාලන්දා විද්‍යාලයේ විද්‍යා ගුරුවරයෙක් වශයෙන් සේවය කළෙමි. මගේ පළමුවන කලා උපාධිය ලබා ගත්තේ 1967 දී විද්‍යාදය විශ්වවිද්‍යාලයෙනි. 1981 වසරේ දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් සාහිත්‍යසූරී ආචාර්ය උපාධියක් ලබා ගැනීමට තරම් වාසනාවන්ත වූ මම එම උපාධි ප්‍රදානෝත්සවයේ දේශනය කිරීමට ද භාග්‍යය ලද්දෙමි.

මෙම පසුබිම යටතේ කළමනාකාර අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ මෙම උපාධි ප්‍රදානෝත්සව දේශනය කිරීමට මා බාර ගත්තේ ඉතාමත්ම සතුටිනි.

අද උපාධි ලබන ඔබ හැමදෙනා ප්‍රාථමික අධ්‍යාපනයෙන් සහ ද්විතීක අධ්‍යාපනයෙන් පසු කෙලින්ම තෘතීය නොහොත් විශ්වවිද්‍යාල අධ්‍යාපනයට යොමු නොවී වෙනත් රැකියාවක් වැනි කාර්යයක නියැලී සිටින ගමන් බාහිර උපාධියක් සඳහා යොමු වූ නිසා ඔබ සහ අභ්‍යන්තර ශිෂ්‍යයන් අතර වෙනසක් තිබේ. එක් අතකින් ඔබ වඩා මුහුකුරා ගිය වයසක සිටින අයයි. ඒවාගේම පාසල් දිවියෙන් පසු කෙලින්ම ජීවිතයේ හා ජීවත්වීමේ අරගලයට සහ තමා අවට තිබෙන ආයතනීය ව්‍යුහයන්ට මුහුණ දී සෑහෙන අත්දැකීම් ලැබූ අයයි. ඒ නිසා ඔබ සැමදෙනාම මෙම උසස් අධ්‍යාපන ආයතනයෙන් ලැබූ දැනුම් සම්භාරය සමාජයේ තිබෙන භෞතික, සාමාජික, ආර්ථික සහ දේශපාලනික පරිසරය දෙස විශේෂ වූ ඇසකින් බලා සමාජයට වඩා නිර්මාණාත්මක සත්කාර්යයක් කිරීමට සුදුසු අවස්ථාවක සිටින බව මගේ පිළිගැනීමයි.

අප සමාජයේ තිබෙන ප්‍රශ්නවල කොටස්කරුවකු වෙනවාට වඩා ඒවා විසඳීමේ හවුල් කරුවෙකු වීමට ඔබ ලැබූ විශ්වවිද්‍යාල අධ්‍යාපනය උදව් වනු ඇත. එම නිසා ලෝක පුරවැසියන් හැටියට අද අප මුහුණ දෙන ගෝලීය ප්‍රශ්න කිහිපයකට ඔබේ අවධානය යොමු කිරීමට මම කැමැත්තෙමි. 1950 ගණන්වල තරුණයන් හැටියට ඒ කාලයේ දී විප්ලවවාදී අදහස් හැටියට සැලකූ කරුණු කිහිපයක් තිබිණි. එයින් සමහරක් නම් අසාධාරණය, හිංසාවට සහ යුද්ධයට විරුද්ධවීම, පාරිසරික විනාශය නවත්වා ජීව ආරක්ෂක පද්ධතීන් රැකගැනීම, පුද්ගලයා සහ කුඩා ජන කොට්ඨාශ ඒකාධිකාරී රාජ්‍යයන්ට සහ වාණිජ සංස්ථාවල බලයට හසුවීමට විරුද්ධව සටන් කිරීම, සමාජ සාධාරණත්වය සහ මානව අයිතිවාසිකම් පිළිබඳ හක්ෂක් නැගීම සහ ආධ්‍යාත්මික සහ සෞන්දර්යාත්මක වටිනාකම් අපේ ජීවිතවලට සම්බන්ධ කර ගැනීම ඒවායින් කිහිපයකි. එදා විප්ලවීය අදහස් හැටියට බල පුළුවන්කාර පිරිස් ප්‍රතික්ෂේප කළ මේ අන්දමේ විෂයයන් අද පොදුවේ පිළිගත් සත්‍යතාවන් හැටියට පත්ව තිබේ.

එදා බාහිරින් සාමකාමීව පෙනුණ සමාජයේ යටිතලයේ සැඟවුණු ගිනි කන්දක් තිබෙන බව අප පැවසුවේ අපේ ජනතාවගෙන් ටික දෙනෙක් අතේ ධනය සහ බලය එක්තැන් වී තිබුණු අතර බහුතර ජනතාව දරිද්‍රතාවයෙන් සහ බලහීනත්වයෙන් පෙළෙන බව දුටු නිසායි. මේ ප්‍රකාශය නිසා සමහරු අපව මාක්ස්වාදීන් හැටියට කැටියට හංවඩු ගැසූහ.

පාරිභෝගික සමාජයක් දෙසට අපේ සමාජයේ බලධාරීන් විසින් ජනතාව ඇදගෙන යනු දුටු අප ජනතාව විසින් කරනු ලබන නිෂ්පාදන වෙනුවට මහා පරිමාණ නිෂ්පාදන ක්‍රමවලට පරිවර්තනය කිරීමට (මහත්මා ගාන්ධිතුමා පෙන්වා දුන් පරිදි) විරුද්ධ වීමු. මෙහිදී නවීකරණයට විරුද්ධ ප්‍රතිගාමීන් හැටියට අපව හංවඩු ගසනු ලැබීය. අතිශය භයානක වූ රසායනික කෘමිනාශක සහ රසායනික පොහොර යොදා කරන කෘෂිකාර්මික නිෂ්පාදනවලට අප විරුද්ධ වූ විට ජනතාව ආහාරවලින් ස්වයංපෝෂිත කිරීමට ගන්නා වෑයමට හරස් වන හණමිටිකාරයින් හැටියට අපව හඳුන්වනු ලැබීය.

1972 වසරේ දී රට ආහාර හිඟයකට මුහුණ දුන් විට සර්වෝදය විසින් ගර්භනී මව්වරුන්ට, දරුවන්ට, රෝගීන්ට සහ වයසක අයට මනා පෝෂණයක් ලබාදීම සඳහා කොළ කැඳ හඳුන්වා දී රට පුරා පොදු මුළුතැන් ගෙවල් ව්‍යාප්ත කරන විට එවකට රජයේ සිටි ඉතාමත් ප්‍රබල ඇමතිවරයෙක් පාර්ලිමේන්තු සභා ගර්භය තුළදී අපට සමච්චල් කළේ කිරිපිටි සුලභ මේ යුගයේ කොළ කැඳ ගැන කතා කරන්නන් ඉතිහාසය පස්සට තල්ලු කරන්න හදන අය වශයෙනි. එහෙත් දෙමසක් ගතවීමටත් පෙර සැලසුම් සම්පාදන අමාත්‍යාංශයේ කොළ කැඳ ඒකකයක් ස්ථාපිත විය.

අවුරුදු පනස්හතක ඉතිහාසයක් ඇති සර්වෝදය සංසදය පක්ෂ සහ බලකාමී දේශපාලනය වෙනුවට සම්මුතිවාදී සහභාගීත්වක දේශපාලන ක්‍රමයක් අප විසින් නිර්මාණය කරගත යුතු යැයි දිගටම කියා සිටියෙමු. ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම විය යුත්තේ දේශපාලන පක්ෂ ක්‍රමය නොව ජනතා පරමාධිපත්‍යය බව අපි ප්‍රකාශ කළෙමු. ඒ වෙනුවට රටේ සෑම ග්‍රාමීය සහ නාගරික ජන කොට්ඨාශයකම ඍජු සහභාගීත්වක ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කළ හැකි බව පෙන්වා දුනිමු. ජනතා පරමාධිපත්‍යය සුරක්ෂිත වන ග්‍රාමස්වරාජ්‍ය නගරස්වරාජ්‍ය සහ ප්‍රජාස්වරාජ්‍ය ක්‍රමයකට රට යොමු විය යුතු බව අපි ප්‍රකාශ කළෙමු.

බෞද්ධ දර්ශනය මත පදනම් වූ ඉතිහාසයක් තිබෙන රටක සෙසු ආගමික සාරධර්ම ද ප්‍රයෝජනයට ගෙන මෙම ජන කොට්ඨාශවල ආධ්‍යාත්මික පදනම ශක්තිමත් කිරීම, නවීන සන්නිවේදන තාක්ෂණය ව්‍යාප්ත කිරීම සහ ජනතා මට්ටමටම බලය විමධ්‍යගත කිරීම යන මාර්ග අපට විවෘත බව අපි ක්‍රියාවෙන්ම පෙන්වා දුනිමු. එවැනි ප්‍රජා පදනමක් යටතේ නවීන විද්‍යා තාක්ෂණය කෙළින්ම ප්‍රජාවට ලබා දී නිෂ්පාදනය ඉහළ නංවා ජනතාවගේ ජීවන, සෞඛ්‍යය හා අධ්‍යාපනය මට්ටම් ඉහළ නැංවිය හැකි බව පෙන්වා දුනිමු. එහෙත් ඒවා බිහිරි අලින්ට වීණා ගැසීමක් මෙන් විය.

පක්ෂ දේශපාලනය නිසා නැතිවෙමින් තිබුණු කුල භේදය අලුත් විය. ජාති භේදය විශාල ලේ වැගිරීම්වලටත් දශක තුනක් පැවැති අතිශයින්ම භයානක යුද්ධයකටත් පෙරළිනි. ජාතිභේද කෝළාහල සහ යුද්ධය පමණක් නොව මේ කාල පරිච්ඡේදයේදී 1971 සහ 1989 දී ඇති වූ ලේ වැගිරීම්වලටත් හේතුව පක්ෂ ක්‍රමයෙන් රටේ ප්‍රජාව සහ සෑම ආයතනයක්ම බෙදී තිබීම බව වරප්‍රසාද ලත් පංතියට තේරුම් නොයෑම රටේ අවාසනාවකි. සාමාන්‍ය පෙළට පමණක්වත් අධ්‍යාපනයක් නොමැති නායකයන් ජනතා පරමාධිපත්‍යය ඔවුන් අතට ගෙන පස, ජලය, වාතය, ගංගා ඇළදොළ, වෘක්ෂලතාදිය ඇතුළු සමස්ත ශ්‍රී ලාංකික භූමිතලයේ පිහිටි ජීවාධාරක පද්ධති සියල්ලම විනාශ කරමින්, නීතියේ

පරමාධිපත්‍යය දුර්වල කරමින්, ඔවුන්ගේ බලය සහ ධනය ගැන පමණක් සිතා පක්ෂ දේශපාලනය මුළු ජනතාවට ම එපා කරවන තත්ත්වයකට ගෙන ගියේය. සමස්තයක් වශයෙන් මුළු ජනතාවගේම සාරධර්ම පද්ධතිය විනාශ විය.

2015 වර්ෂය ලබන විට පක්ෂ දේශපාලනය නිසා ජාතියේ සාරධර්ම ඇතුළු ජීවාධාරක පද්ධතීන් විනාශවීමේ ඊනියා සංවර්ධන සහ දේශපාලන ක්‍රමය ප්‍රතික්ෂේප කිරීමට තරම් ජන විඤ්ඤාණය මුහුකුරා ගොස් තිබුණේය. අපේ ජනතාවගේ දේශපාලන විඤ්ඤාණය ගැන සලකා බලන විට පසුගිය ජනවාරි 8 වැනි දා සමස්තයක් වශයෙන් ශ්‍රී ලාංකික ජනතාව ගත් තීරණය අපේ ජන විඤ්ඤාණයේ ඓතිහාසික ක්‍රියාත්මක වීමක් හැටියට මම සලකමි. ජනමාධ්‍යවලින්, කට කතාවලින් විශාල ධනස්කන්ධ වියදම් කරමින් රාජ්‍ය සහ රාජ්‍ය නොවන කණ්ඩායම් මාර්ගයෙන් ප්‍රචණ්ඩත්වය යොදා ගනිමින් අල්ලස්, දූෂණ, වංචා ක්‍රියාමාර්ග උපයෝගී කර ගනිමින් මහජනතාව මුලා කිරීමේ සීමාවක් තිබෙන බව එම අවස්ථාවේදී හැමටම අවබෝධ විය. මනුෂ්‍ය ප්‍රජාවක් තුළ තිබෙන සාමූහික විඤ්ඤාණයේ ශක්තිය අන් සියලුම ජාති, පක්ෂ, ආගමික මතවාදවලට වඩා බලවත්ව ක්‍රියාත්මක වන ශක්තියක් බවත්, එය කතා කරන හෝ ලියන වචනවලට ඔබ්බෙන් තිබෙන නොපෙනෙන ශක්තියක් බවත් එදා පැවැති ජනාධිපතිවරණයෙන් ස්ඵුට විය. මෙම ඡන්ද ප්‍රතිඵලය මා දකින්නේ පුද්ගලයෙකුගේ ජයක් හෝ පරාජයක් හෝ ලෙස නොව ජන විඤ්ඤාණයේ අවදිවීමක් ලෙසයි.

ජන විඤ්ඤාණය ස්වභාවයෙන්ම අනුමත කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදයයි. සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය සහ ව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදය අතර වෙනස් අවබෝධ කර ගැනීමේ හැකියාවක් ජන විඤ්ඤාණයට තිබේ. ව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී බල කණ්ඩායම්වලට ඒකාධිපතිත්වය කරා යාමට හැකි දුරක් තිබේ. ජන විඤ්ඤාණයේ තීරණාත්මක ස්කන්ධයක් ගොඩනැගුණු විට ඒකාධිපති ප්‍රවණතාවන් විනාශ වී ප්‍රජාතන්ත්‍රවාදී මඟක් නැවත විවෘත කරයි. අද අප ඉදිරියේ විවෘත වී ඇත්තේ ඒ මාර්ගයයි. මෙය ආරක්ෂා කර ගැනීම ප්‍රජාතන්ත්‍රවාදය අගයන සෑම පුරවැසියෙකුගේම වගකීමයි. නව සාමාජික, ආර්ථික, දේශපාලන දැක්මක් ඇති කර ගැනිමට මේ උචිතම කාල පරිච්ඡේදයකි.

ඔබ ඇතුළුවන සැබෑ ලෝකය දෙස බලන්න. අඩු වශයෙන් පනත සඳහන් ගෝලීය ප්‍රශ්නවලට ඔබට කළ හැක්කේ කුමක්දැයි සිතන්න. නම් වශයෙන් සඳහන් කළහොත් ගෝලීය කාලගුණ විපර්යාස, පාරිසරික දූෂණය, වන විනාශය සහ කාන්තාරකරණය, දුප්පත්කම, ත්‍රස්තවාදය සහ යුද්ධය, බලශක්ති අර්බුදය සහ ආධ්‍යාත්මික පරිහානිය මෙයින් සමහරකි.

මේ ප්‍රශ්නයට විසඳුම් සෙවීමේ වගකීම් විශාල වශයෙන් පැටවෙන්නේ කළමනාකරණ සහ වාණිජ අංශයේ සහ රාජ්‍ය පරිපාලන අංශයේ සේවක පිරිස් මතයි. අද උපාධි ලබන ඔබගෙන් වැඩි දෙනෙකු මේ අංශ දෙකට යන බවයි මා විශ්වාස කරන්නේ. ඒකාධිපතිත්වය කරා යන දේශපාලනයේ නිවුන් සොහොයුරන් වන්නේ රාජ්‍ය පරිපාලනය සහ බහුජාතික ව්‍යාපාර අංශයේ ප්‍රධානීන්ය. අද උපාධි ලබන ඔබගෙන් බහුතරය සේවය සඳහා යන්නේ මෙම අංශ දෙකට බව මම නැවතත් අවධාරණය කරමි. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ක්‍රමයක ආරක්ෂකයන් වශයෙන් සමස්ත ජනතාවටම යුක්තිය, සාධාරණත්වය සහ නීතියේ පරමාධිපත්‍යය සැලසෙන මානවවාදීන් හැටියටත් ඔබ අනුගමනය කළයුතු යැයි මා විශ්වාස කරන සාරධර්ම පද්ධතියක් යෝජනා කරමින් මගේ මෙම දේශනය හමාර කරමි.

පළමුව, ඔබත් අපත් හැදුනු වැඩුනු සංස්කෘතියේ උරුමක්කාරයන් ලෙස ඔබ මෙම විශ්වවිද්‍යාලයේදී ලත් විද්‍යා තාක්ෂණික දැනීම, ඔබගේ පෞරුෂය හෙවත් නාමරූප ස්වභාවයේ ඇතුළාන්තය දෙස

බැලීමෙන් ඇතිවන ප්‍රඥාව සමඟ සම්බන්ධ කර ඔබේ සේවා ජනතාව සඳහා මෙහෙයවීමට තරම් ඔබ බුද්ධිමත් විය යුතුය.

දෙවැනිව, ඔබගේ ජීවන රටාව සහ සේවා වගකීම් පවත්වා ගෙන යෑමේදී ඔබ ක්‍රියාත්මක වන්නේ ඒකියාවක කොටු වූ පරිසරයක නොව ගෝලීය වශයෙන් එකිනෙකාට සම්බන්ධ වූ අන්තර් ජාලීය පරිසරයක බව අමතක නොකළ යුතුය.

තෙවැනිව, පරිසරය, ජීවාධාරක පද්ධතීන් විනාශ කරන විෂ ආහාර නිපදවන, මනුෂ්‍යයා ඇතුළු ජීව ප්‍රාණීන් ඝාතනය කරන, අපේ සදාචාර පද්ධතිය විනාශ කරන කැසිනෝ, සූදු, මත්වතුර, මත්ද්‍රව්‍ය ආදියට සම්බන්ධ කිසිදු ඒකියාවක නොයෙදීමට තරම් ඔබට ආත්ම ශක්තියක් තිබිය යුතුය.

සිව්වැනිව, අන්ධානුකරණයෙන් පාරිභෝගික ජීවන රටාවකට හුරුවීමට පුරුදු නොවී සරල චාම් ජීවන රටාවකින් තමාගේත් තම පවුලේත් ප්‍රීතිමත් සාර්ථකත්වයක් ලබා ගත හැකි බව විශ්වාස කළ යුතුය.

පස්වැනිව, අද අප ජීවත් වන සමාජයේ පවතින දේශපාලන, ආර්ථික මතවාද සහ ව්‍යුහයන් කිසිසේත් අප මුහුණ දෙන දරිද්‍රතාව, විරැකියාව, පවුල් සහ ආයතනීය කණ්ඩායම්වල සිට ජාතික වශයෙන් අද පවත්නා බෙදීම සහ අසමගිකම දුරලීමට අසමත් වන බව තේරුම් ගෙන තමා ලැබූ සෛද්ධාන්තික දැනීම සහ ප්‍රායෝගික අත්දැකීම් ශ්‍රී ලංකාවේ නව ආර්ථික, දේශපාලන දර්ශනයක්, ක්‍රියාමාර්ග සහ ව්‍යුහයන් ගොඩනැගීමට දායකවීමට ඔබේ නිර්මාණ කෞශල්‍යයන් යොදා ගැනීම ද කළයුතු බව මගේ අදහසයි.

මෙම විශ්ව විශ්වවිද්‍යාලයේම ඉගෙන ගත් කෙනෙකු හැටියටත් ඔබට වඩා වැඩිමහල් කෙනෙකු හැටියටත් දශක හයකට කිට්ටු කාලයක් මෙතෙක් මා සඳහන් කළ දර්ශනය, ප්‍රතිපත්තීන් හා ක්‍රියාදායමයන් ස්වශක්තිය, සාමූහිකත්වය, විද්‍යාත්මක සංවිධාන ක්‍රමයන් ආදිය තුළින් බලකාමී පක්ෂ දේශපාලනයට හවුල් නොවී ලක්ෂ සංඛ්‍යාත දේශීය සහ ලෝක ජනතාවට සේවයක් කිරීමට හවුල් වූ කෙනෙක් හැටියටත් මා ඉහත සඳහන් කළ උපදෙස් ගැන ගැඹුරට කල්පනා කරන්න. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කීර්ති නාමය තවදුරටත් ලොව පුරා පැතිරවීමට ඔබ සමත් වේ යැයි ආශිංසනය කරමින් මට මෙම උපාධි ප්‍රදානෝත්සව දේශනය කිරීමට ඇරයුම් කිරීම පිළිබඳව පීඨාධිපතිතුමන් ඇතුළු සියලු දෙනාටම මගේ කෘතඥතාව පළ කරමින් මම නිහඬ වෙමි.

<u>*2015.07.13*</u>